# අපේ පුංචි
# තුන් ඉරි
# අප්පු



මෙනුලි ගිහංසා හේවාගමගේ

කෘතියේ නම - අපේ පුන්චි තුන් ඉරි අප්පු.

කතෘ - මෙනුලි ගිහංසා හේවාගමගේ.

ලිපිනය - 228/8,

පළමු කෘතිය - 2023 දෙසැම්බර් 13

# පිදුම

අපට අකුරු කියා දුන් ගයානි ගුරු මැණියන්ට ද , පොතක් ලිවීමට දිරිමත් කළ සමන්මලී ගුරුමැණියන්ට ද , නිවසේ උදව් උපකාරී කළ දෙමව්පියන්ට ද , චිත්‍ර ඇඳීමට උදව් කළ මයුමි සඳුපමා හේවාගමගේ යන මාගේ සොයුරියට ද, සෙනෙහසින් හා ආදරෙන් පුදමි.

# ස්තූතිය.

*************

මා හට පොත් ලිවීමට උදව් කළ සමන්මලී ගුරු මෑණියන්ට ද,දෙමාපියන්ට ද චිත්‍ර ඇඳීමට උදව් කළ සොයුරියට ද

මාගේ හදපිරි ස්තූතිය පුද කරමි.

****

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිද කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවන්ගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැන්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස්ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබුණු සුවිශේෂ ජයග්‍රහණය ක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසැල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය  මෙවර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " වැඩසටහන හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසැල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023. සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසැල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " වැඩසටහනට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු.

මෙම වැඩසටහන වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසැල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ගරු විදුහල්පති

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර

2023.11.01

දවසක් උදෑසන මහා හඬින් ලේනෙක් කෑ ගසනවා අපිට ඇහුණා.



# අපි දොර ළඟට ගිහින් බැලුවා.



අපේ කිටී
ලේනාව අල්ලන්න.
යනවා අපි දැක්කා.



මමත් සහ තාත්තාත් මිදුලට ගිහින් ලේනාව බේරාගෙන ආවා.



අම්මා ලේනාට බොන්න කිරිත් හදලා දුන්නා.



# තුන් ඉරි අප්පුට
# දැන් සනීපයි.



අපි එයාට නිදහසේ ඉන්න ගහ උඩින් තිබ්බා.



ඒත් තුන් ඉරි අප්පු ගියේ නෑ.

අපි ළඟට ආපහු ආවා.



එයා අපිත් එක්ක ඉන්න කැමති නිසා අපි එයාව ගෙදර තියාගෙන ආදරෙන් බලාගත්තා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසැල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔහුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාව ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශය ට පෞද්ගලි යෝජනාවක් ලෙස පාසැල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසැල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසැල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන්  වෙත ළගාවීමට නූතන තාක්ෂනය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය  දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට  මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසැල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පැමිණි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරියක් වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසැල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කල ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01